**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2014 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 12 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.5,475,307 ක වියදමින් ඉදිකරන ලද වීරහේන ආදාහනාගාරය, නාත්තන්ඩිය නගර ශාලා ගොඩනැගිල්ල, ජල ව්‍යාපෘති 02 ක්, නාත්තන්ඩිය වෙළඳ සංකීර්ණය, මාරවිල සුපිරි වෙළඳ සංකීර්ණය, දෙමටපිටිය වෙළඳ සංකීර්ණය සහ හාල්පන්විල කඩ කාමර යනාදියේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2009, 2012 හා 2013 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණවලදී හඳුනාගෙන තිබූ රු.223,091 ක් වටිනාකමැති පුස්තකාල පොත් ඌනතාවය ස්ථාවර වත්කම් වලින් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශේෂ පත්‍රයේ දැක්වෙන රු.12,412,706 ක මුදල් ශේෂය තුල 2001 වර්ෂයේ සිට 2010 වර්ෂය අතර කාල සීමාව තුල අහරු වූ චෙක්පත් 11 ක වටිනාකම වූ රු. 748,240 ක් ද ඇතුළත්ව තිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**
**---------------------------**

හිඟ වරිපනම් බදු, ජල බදු හා අක්කර බදු යන ආදායම් විෂයයන්හි ලෙජර ගිණුම් අනුව ශේෂවල එකතුව රු.24,193,746 ක් හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂවල එකතුව රු.23,164,830 ක් වූ අතර, එම ශේෂ අතර රු.1,028,916 ක නොසැසඳු වෙනසක් අනාවරණය විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 254,338,973 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **බැංකු සැසඳුම්**

බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වෙන විග්‍රහයට අනුව වටිනාකම රු. 757,267 ක් වූ අගරු චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.61,597,179 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 56,557,906 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **ආදායම් විෂයය** | **ඇස්තමේන්තුගත** | **තථ්‍ය** | **දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
|---|---|---|---|
| | **රු. '000** | **රු. '000** | **රු. '000** |
| වරිපනම් හා බදු | 17,814 | 15,295 | 22,902 |
| බදුකුලී | 20,947 | 21,893 | 2,224 |
| බලපත්‍ර ගාස්තු | 1,008 | 1,018 | 87 |
| වෙනත් ආදායම් | -- | 57,316 | 139,975 |

**2.2.2 වරිපනම් බදු**

**---------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කල වරිපනම් බදු මුදල වූ රු.15,929,547 න් වර්ෂය තුල දී රැස්කර ගෙන තිබුණේ සියයට 54 ක ප්‍රමාණයක් පමණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | | රු. |
|---|---|---|---|
| (i). | උසාවි දඩ | - | 2,930,854 |
| (ii). | මුද්දර ගාස්තු | - | 74,970,732 |

**2.3 අධිභාර**

**----------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවා තිබූ අධිභාර සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 1,805,437 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත නිරික්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් සභාව වෙත පනවා තිබූ අධිභාර සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,570 ක් ගෙවා තිබූ අතර, ඉදිරියේ දී ඒ වෙනුවෙන් තවත් රු.94,770 ක් ගෙවීමට නියමිතව තිබුණි.

(ආ) 2004 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බදුකරුවන් 19 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ හිඟ බදු කුලී රු.1,356,500 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුල දී කටයුතු කර නොතිබුණි.

(ඇ) 2000 වර්ෂයේ සිට 2004 සැප්තැම්බර් 31 දින දක්වා වෙන්නප්පුව විදුලි ඉංජිනේරු වෙතින් ලැබිය යුතු විථි ආලෝක ප්‍රතිපූර්ණ මුදල වූ, රු.1,167,000 ක් සභාවට ලැබිය යුතුව තිබුණි.

(ඈ) පළාත් පාලන මහ සංගමය විසින් 1999 වර්ෂයේ දී ලබාගෙන තිබූ රු.100,000 ක මුදල ආපසු ලබාගැනීමට ක්‍රියාකර නොතිබූ අතර, 2007 වර්ෂයේ සිට ලැබිය යුතු පොලී මුදල් ගණනය කිරීම ද අත්හැර දමා තිබුණි.

(ඉ) 2009, 2012 හා 2013 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණවලදී හඳුනාගෙන තිබූ රු.119,064 ක් වටිනාකමැති පුස්තකාල පොත් අස්ථානගත වීම සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන පොත්වල වටිනාකම හා දෙපාර්තමේන්තු ගාස්තුව වන රු.29,766 ක් අයකරගෙන නොතිබුණි. තවද එම වටිනාකම ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම්ගත කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**4.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය
(ඊ) සේවක ණය